## 74 – යුද්දෙට අත් මගෙ

යුද්දෙට අත් මගෙ පුහුණු කරන්නේ
රණසූරු කෙළියට ඇඟිලි මගේ
මගෙ සල වන ඔබ සමිඳරුවානේ
සුබ සෙත් ආසිරි ඔබටත් වේ

ඔබ මගෙ සාගරෙ කරුණා වේ
ඔබයි මගේ බලකොටුවේ
ඔබයි ඔබයි මගෙ රකවරණේ
ගැලැවුම් කරුවෝද මගේ

පලිහත් මගෙ පිළිසත් තැනො’බේ
යට කැරැ දෙති මට ජනයා
තකනට යම්තම් වත් මිනිහා
කවුරුද හෝ නම් සමිඳේ

මිනිස් පුතකු හැටියට ඔබගේ
සිහියට ගන්නට කවුදේ
හෙළන හුස්මකට හෝ සමවේ
ඔහුගෙ දවස් හෙවණැල්ලේ